සුරාබදු කොමසාරිස් ජනරාල්
ஆணையாளர் நாயகம்
Commissioner General
3888022
3888023

අතිරේක සුරාබදු කොමසාරිස් ජනරාල්
(ආදායම් ප්‍රතිපත්ති හා පාලන)
மேலதிக ஆணையாளர் நாயகம்
(வருமானக் கொள்கை, நிர்வாகம்))
Additional Commissioner General (Revenue Policy & Admin)
2045050

අතිරේක සුරාබදු කොමසාරිස් ජනරාල්
(ආදායම් මෙහෙයුම් හා නීති ක්‍රියාත්මක කිරීම)
மேலதிக ஆணையாளர் நாயகம்
(வருமான முகமைத்துவம், சட்டவலுப்படுத்தல்)
Additional Commissioner General (Revenue Management&Law Enforcement)
2877891

ෆැක්ස්
பெக்ஸ்
Fax
2877890

ඊ-මේල්
மின்னஞ்சல்
E-Mail
excisen@slt.lk

දුරකථන අංකය
தொலைபேசி எண்.
Telephone No
2045000

# ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුව
# இலங்கை மதுவரித் திணைக்களம்
# EXCISE DEPARTMENT OF SRI LANKA

අංක 353, කෝට්ටේ පාර, රාජගිරිය. இல.353,கோட்டை வீதி,இராஜகிரிய.No 353, Kotte Road, Rajagiriya.

මගේ අංකය. / எனது இல: / My No. ED/2/4/2/2021

ඔබේ අංකය. / உமது இல: / Your No.

දිනය / திகதி / Date 2020.12.

සහකාර සුරාබදු කොමසාරිස්වරුන්,
සුරාබදු අධිකාරීවරුන් සහ
සුරාබදු ස්ථානාධිපතිවරුන් මගින්
අදාල නිලධාරීන් වෙත

<u>වාර්ෂික ස්ථාන මාරුවීම් සමාලෝචන තීරණ - 2021</u>
<u>ප්‍රධාන සුරාබදු පරීක්ෂක/ සුරාබදු පරීක්ෂක</u>

මගේ සමාංක හා 2020.08.12 දිනැති නිවේදනය අනුව 2021 වාර්ෂික ස්ථාන මාරු වීම් සඳහා ඔබ විසින් ඉදිරිපත් කරන ලද අයදුම්පත් සම්බන්ධයෙන් මෙම දෙපාර්තමේන්තුවේ ස්ථාන මාරු මණ්ඩලය විසින් ගනු ලැබූ තීරණවලට එරෙහිව ඔබ විසින් එවන ලද අභියාචනා 2020.12.23 වන දින පැවති ස්ථාන මාරු සමාලෝචන කමිටුවට යොමු කිරීමෙන් පසු එම කමිටුව විසින් ගන්නා ලද තීරණ මෙයින් දන්වා සිටිමි.

02. මෙමගින් නිවේදනය කරනු ලබන සියලු ස්ථාන මාරුවීම් 2021.01.15 දින සිට ක්‍රියාත්මක කළ යුතු අතර, ස්ථාන මාරුවීම් ක්‍රියාත්මක කිරීමේදී සියලුම නිලධාරීන් 2021.01.15 දින නව සේවා ස්ථාන වලට වාර්තා කිරීමට හැකිවන පරිදි වර්තමාන සේවා ස්ථානයෙන් විධිමත් පරිදි පූර්ව අනුමැතිය ඇතිව ස්ථාන මාරුවී යාමට ක්‍රියා කළ යුතු ය. නව සේවා ස්ථානයට වාර්තා කිරීමට පෙර තමන් භාරයේ ඇති රජයේ බඩු බාහිරාදිය සහ ලිපිලේඛන නිසි පරිදි භාරදිය යුතු ය. අධිකරණ නඩුවලට අදාළ ලියකියවිලි නම් කරන ලද සුදුසු නිලධාරියෙකුට ලිඛිතව භාරදිය යුතු ය.

03. ස්ථාන මාරුවීම් ක්‍රියාත්මක වන දිනෙන් ඔබ්බට කිසිඳු නිලධාරියෙකු සඳහා සේවා ස්ථානයක ප්‍රධානියෙකු විසින් නිවාඩු අනුමත නොකළ යුතු ය. යම් හෙයකින් නව සේවා ස්ථානයට වාර්තා කිරීමට නියමිත දින සිට නිවාඩු අවශ්‍ය වූවහොත් ඒ බව නව සේවා ස්ථානයේ ප්‍රධානියාට දන්වා නිවාඩු ලබා ගත යුතු ය. අසනීප නිවාඩු ලබා ගතහොත් ආසන්න රජයේ රෝහලක වෛද්‍ය නිලධාරියෙකු විසින් නිකුත් කළ වෛද්‍ය සහතිකයක් ඉදිරිපත් කළ යුතු ය. එසේ කිරීමට අපොහොසත් වූවහොත් එම දිනයන් වැටුප් රහිත නිවාඩු සේ සලකා කටයුතු කිරීමට හෝ සේවය අතහැර ගිය අයෙකු සේ සැලකීමට හෝ වෙනත් විනය ක්‍රියා මාර්ගයකට භාජනය කිරීමට සිදු වනු ඇත.

04. නව සේවා ස්ථානවල රාජකාරි සඳහා වාර්තා කළ විගස ඒ බැව් එදිනම සුරාබදු ස්ථානාධිපති, සුරාබදු අධිකාරී සහ සහකාර සුරාබදු කොමසාරිස් මඟින් මා වෙත වාර්තා කිරීම අත්‍යාවශ්‍ය වේ.

05. අදාළ ස්ථානාධිපතිවරුන් තමන් යටතේ සේවය කරනු ලබන ස්ථාන මාරුවීම් ලබා සිටින නිලධාරීන්ට ඔවුන්ගේ ස්ථාන මාරුවීම් නියෝග ලිඛිතව දැන්විය යුතු ය. නිලධාරීන් ස්ථාන මාරු වී යාමට පෙර වරෙන්තුකරුවන් සම්බන්ධ කටයුතු අවසන් කර ගැනීමට ක්‍රියා කළ යුතු ය.

06. නියමිත ස්ථානවල සේවා කාලය සම්පූර්ණ කළ නිලධාරීන්ට මෙම ස්ථාන මාරුවීම් සඳහා ආයතන සංග්‍රහයේ විධි විධාන පරිදි ගමන් වියදම්, රාජකාරී නිවාඩු හා රාජකාරී දුම්රිය බලපත්‍ර ලබා ගත හැකි ය.

07. වාර්ෂික ස්ථාන මාරු සම්බන්ධව රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත අභියාචනා ඉදිරිපත් කරන්නේ නම් කාර්ය පරිපාටික රීති සංග්‍රහයේ 23 වන පරිශිෂ්ටය ප්‍රකාරව 2021.01.12 දිනට පෙර මා වෙත එවිය යුතු බව කාරුණිකව දන්වමි.

එම්.ජේ. ගුණසිරි
සුරාබදු කොමසාරිස් ජනරාල්

පිටපත් :

| | | |
|---|---|---|
| 1. | ප්‍රධාන ගණකාධිකාරී | - කා.දැ.ස. |
| 2. | සියලුම සුරාබදු කොමසාරිස්වරුන් | - කා.දැ.ස. |
| 3. | සියලුම නියෝජ්‍ය සුරාබදු කොමසාරිස්වරුන් | - කා.දැ.ස. |
| 4. | අදාළ වෘත්තීය සමිතිවල ලේකම්වරුන් | - කා.දැ.ස. |